**වසර 200 ක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙන මලෛයගම් (වතුකරයේ) ජනතාවගේ, විශේෂයෙන් දකුණු පළාත් මලෛයගම් ජනතාවගේ අභිවෘද්ධිය සඳහා දකුණු පළාත් සිංහල, මුස්ලිම් හා මලෛයගම් ජනතාව නියෝජනය කරමින් රජයට ඉදිරිපත් කරන යෝජනා.**

"වතුකරයේ ජනතා හඬ" සංවිධානය දකුණු පළාතේ මාතර, ගාල්ල, කලුතර, කුරුණෑගල හා මලෛයගම් ප්‍රදේශ වලින් (වතුකරයේ) සංක්‍රමණයවී මේ වන විට ගම්පහ දිස්ත්‍රික්කයේ විවිධ පීඩාකාරී තත්වයන් තුල ජීවත්වන මලෛයගම් (වතු) ජනතාව සමග ඒකාබද්ධව කටයුතු කරමින් මලෛයගම් ජනතාවගේ අයිතීන් සහ සුභසාධනය උදෙසා ක්‍රියාත්මක වන සිවිල් සංවිධානයක්වේ. මෙම සංවිධානය සිංහල, දෙමල හා මුස්ලිම් හා මලෛයහම් ජනතාව අතර සංහිදියාව වර්ධනය කිරීම සඳහා පසු ගිය මාස 06 තුල ප්‍රජාතන්ත්‍රවාදය හා සංහිදියාව පිලිබඳව ඉහත සඳහන් කණ්ඩායම්වල තරුණ තරුණියන් හා කාන්තාවන් ඒකාබද්ධ කරමින් මාතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල සංවාද 06 ක් පවත්වන ලදී. මෙයට සහභාගිවූවන් මලෛයගම් ජනතාව මුහුණ දෙන ගැටළු පිලිබඳව සාකච්ජා කල අතර, ගැඹුරු විග්‍රහයක් කර ගන්නා ලදී. එම ගැටළු විසදීම සඳහා දකුණු පළාතේ ආණ්ඩුකාරතුමා, රාජ්‍ය නිලධාරින්, ආගමික නායකයින් හා සිවිල් සංවිධාන සමග සාකච්ජා කලයුතු බවට යෝජනාවූ අතර එම ගැටලු විසදාගැනීම සඳහා ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කිරීමටද යෝජනා වුනි. ඒ අනුව ඉහත සඳහන් වැඩමුළු 06 ට සහභාගිවූ නියෝජිතයින් සාකච්ජා කර මේ සඳහා වන යෝජනා ගොනු කරන ලදී. ඒ අනුව 2024.06.12 වන දින එම ඉල්ලීම් ඔබතුමන්ලා වෙත මෙසේ භාර දීමට කටයුතු කරමු. මෙය පිලිබඳව ඔබතුමන්ලාගේ අවධාන යොමු කර, මලෛයගම් ජනතාවගේ අභිවෘර්ධිය ගොඩනැගීම සඳහා කටයුතු කර මෙන් ඉල්ලා සිටිමු.

**ඉඩමක අයිතිය/ඉඩමේ නීත්‍යානුකුල හිමිකාරිත්වය**

1. 1993 - 2018 වර්ෂය දක්වා විවිධ අවස්ථාවල ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල මේ දක්වා පර්චස් 7ක ඉඩම් ලබාදී ඇති මලෛයගම් ජනතාවගේ ඉඩම්වලට ඔප්පු ලබා දී, ඉඩමේ නීත්‍යානුකුල හිමිකාරිත්වය තහවුරු කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීම.
2. මෙතෙක් ඉඩම් හෝ නිවාස නොලැබුණු දකුණේ මලෛයගම් ජනතාවට ඉඩම් හා නිවාස ලබා දීමට කටයුතු කිරීම සඳහා වර්ථමානයේ රජය විසින් මලෛයගම් ජනතාව සඳහා දියත් කරන ඉඩම් සහා නිවාස ලබාදීමේ ව්‍යාපෘතියට මාතර සහ ගාල්ල දිස්ත්‍රික්ක 02 ද ප්‍රමුකතා ගත කිරීමට පියවර ගැනීමට කටයුතු කිරීම සහ වැව්ලි ඉඩම් ආරවුල් සඳහා විශේෂිත කාර්ය සාධක බලකායක් නිර්මාණය කිරීම.
3. ඉඩම් ලැබුණු පුද්ගලයින්, ඉඩම් සහ නිවාස ඇති පුද්ගලයින් මෙන්ම ඉඩම් හිමිකම් ලබා දී ඇති පුද්ගලයින්ගේ සංඛ්‍යාව ඇතුළුව සවිස්තරාත්මක දත්ත ඒකරාශී කිරීම සඳහා විදිමත් යන්ත්‍රනයක් ගොඩ නැගිම.

**මලෛයගම් ජනතාවගේ මූලික පහසුකම් ගොඩ නැගීම හා රාජ්‍ය සේවාවන්, මලෛයගම් ජනතාවටද නිසි අයුරින් ලබා දීම.**

1. වතු ආශ්‍රිතව මූලික සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය වශයෙන් රෝහල් පහසුකම් ඇති කිරීමට කටයුතු කිරීම සහ දැනට පවතින රෝහල් සහ සායනවලට පැමිණෙන රෝගීන් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදිම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීම.
2. පානීය ජලය, වැසිකිලි පහසුකම් හා මේ වන විට ප්‍රාදේශීය සභා හරහා වතු තුල කසල එකතු කිරීමේ ක්‍රියාවලිය නිසි පරිදි සිදුනොවන බැවින්, කසල බැහැර කිරීම සඳහා වන මූලික පහසුකම් නිසිලෙස සංවර්ධනය කිරීමට පියවර ගැනිම.

3. වතුවලට සහ ඉන් පිටතට නිසි ප්‍රවේශයන් සහතික කිරීම සඳහා මාර්ග ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණය කිරීම් සහ විධිමත්ව නඩත්තු කිරීමට කටයුතු කිරීම.

4. මේ වන විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුවට අනුගතව වතු තුල තැපැල් බෙදා හැරීම විධිමත් කිරීම සඳහා වතුවල ජීවත්වන මලෙයගම් ප්‍රජාවගේ සෑම නිවසකටම වෙනම ලිපිනයන් ලබා දීම සඳහා කඩිනමින් බලධාරින් කටයුතු කිරීම.

5. රජයෙන් ලබා දෙන අස්වැසුම, හා වැඩිහිටි දීමනා නොලැබුනු වතුවල ජීවත්වන මලෙගම් ජනතාවටද එම දීමනා ලබා දීමට කටයුතු කිරිම සහ එහි ඇති අක්‍රමිකතා පිළිබඳව සොයාබැලීමට විනිවිදභාවයෙන් යුක්ත වැඩපිළිවෙලක් සකස් කිරීම .

6. රජයේ ආයතන සඳහා දෙමළ භාෂාවෙන් කටයුතු කල හැකි දමිල රාජ්‍ය නිලධාරින් පත්කිරීම හෝ පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් පියවර ගැනීම .

7. රජය විසින් පොරොන්දුවූ පරිදි රු 1700 ක් ලෙස වතුකම්කරු ජනතාවගේ වැටුප් වැඩි කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීම.

**මලෙයගම් දරුවන්ගේ පාසල් අධ්‍යාපනය හා වෘත්තිය පුහුණු පහසුකම් ගොඩනැගිම.**

1. දකුණු පළාතේ දමිල පාසල් 10 තුල ගණිතය / විද්‍යාව / ඉංග්‍රිසි වැනි විෂයන් සඳහා අනිකුත් පාසල් වලට සාපේක්ෂව ගුරුවරුන් ස්ථාපිත කිරීම සඳහා කඩිනමින් පියවර ගැනීමට කටයුතු කිරීම.

2. පාසල් අධ්‍යාපනය අවසන් කර ඇති මලෙයගම් තරුණ තරුණියන් සඳහා දමිල භාෂාවෙන් ක්‍රියාත්මක වන වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම සහ ඒ ආශ්‍රිත රැකියා අවස්ථා බිහි කිරීම.

3. දකුණු පළාතේ වතු ප්‍රදේශවල ජීවත් වන මලෙයගම් ජනතාවගේ දරුවන්ගෙන් වැඩි ප්‍රමාණයක ගැහැණු දරුවන් පාසල් අධ්‍යාපනය මගදී හැර යයි. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ගැඹුරු විශ්ලේෂණයක් කර දකුණු පළාතේ දරුවන්ගේ පාසල් අධ්‍යාපනය ඉහළ නැංවීමට පියවර ගැනීම සඳහා කටයුතු කිරීම.

4. මලෙයගම් දරුවන්ගේ අයිතීන් හා සංස්කෘතික හැකියාවන් වර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා විශේෂ වැඩ පිළිවෙලක් සකස් කිරීම.

5. ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන කුඩා හා පෞද්ගලික වතුවල අවුරුදු 16 ට අඩු ළමුන් ළමා ශ්‍රමිකයන් ලෙස කටයුතු කරන බවට සියලු තොරතුරු ඇතත් ඒ පිළිබඳව ඔවුන් සාක්ෂි දැරීමට බියවේ. එබැවින් ඒ පිළිබඳව සොයා බලා අදාල නීතිමය පියවර ගැනීම සඳහා විශේෂ කමිටුවක් පත්කිරීම.

**මලෙයගම් කාන්තාවන්ගේ අභිවෘද්ධිය ගොඩ ගැනීම.**

1. මලෙයගම් කාන්තාවන් ද සමාජීය පිළිගැනීමකට ලක්කිරීම සඳහා මලෙයගම් කාන්තාවන්ගේ (කඳුකර) අධ්‍යාපනය සහ පෞරුෂ සංවර්ධනය සඳහා ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගැනීම.

2. කාන්තාවන් සඳහා ප්‍රාදේශීය, රාජ්‍යය සහ පළාත්පාලන මට්ටමින් ලබාදෙන සේවාවන් වතුකරයේ කාන්තාවන්ටද ලබා ගැනීමට නිසි ක්‍රමවේදයක් සැකසීම.

3. වතුවල සේවය කරන මලෙයගම් කාන්තාවන්ගේ අනාගත ඉතුරුම් සඳහා ඇති EPF / ETF ලබා නොදෙමින් ක්‍රියාත්මක වන Out Grower System (වතු කම්කරුවන්ට තේ වතු කුඩා ප්‍රමාණ වලට බෙදා වෙන්කර ඒවා නඩත්තු කිරීම සඳහා භාරදීමේ ක්‍රියාවලිය) වහා ඉවත් කර, පැරණි ක්‍රමයටම කාන්තාවන්ට දෛනික රැකියාව ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

4. ග්‍රාමීය කාන්තාවන් විධිමත් බැංකු මඟින් ණය ලබා ගැනීමට යොමු නොවීමට ප්‍රධාන හේතුව වන්නේ විධිමත් බැංකු ණය නිකුත් කිරීමේදී විවිධ ලිපි ලේඛන සම්පූර්ණ කිරීමට හා ඇප කොන්දේසි සපුරාලීම මඟින් කාන්තාවන් අපහසුතාවයට පත් කිරීමයි. ඒ අනුව සරල ක්‍රමවේද තුළින් විධිමත් බැංකු ක්‍රමවේදයක් මඟින් කාන්තාවන්ට සුවිශේෂී වන ණය ලබා ගැනීමට හැකි ක්‍රියාවලියක් හඳුන්වා දීම.

5. තේ වතුවල වැසිකිළි පහසුකම් හා විවේකාගාරයක් නොමැති බැවින් එහි සේවය කරන කාන්තාවන් දැඩි පීඩාවට ලක්වේ. එබැවින් මෙය පිලිබදව අවධානය යොමු කර අදාළ පහසුකම් ලබා දෙන ලෙස වතු සමාගම්වලට උපදෙස් ලබා දීම.

6. තම පවුල්වල දරිද්‍රතාවය සහ ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීමේ අරමුණින් ගෘහ සේවිකාවන් ලෙස විදේශගතවන මලෙයගම් කාන්තාවන්ගේ පවුල්වල සහ දරුවන්ගේ තත්ත්වය නිරීක්ෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගැනීම.

**මාතර හා ගාල්ල දිස්ත්‍රික් සිංහල මුස්ලිම් කාන්තාවන් හා තරුණ නියෝජිතයින් හා වතුකරයේ ජනතා හඬ සංවිධානය**